Remove Watermark Now

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

පළමු වාර පරීක්ෂණය - 2019 මාර්තු

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I,II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

11 ශ්‍රේණිය | කාලය පැය 03 යි

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කැළයෙන් අහුලාගත් මදටිය ඇට, ඔළිඳ ඇට, රබර් ඇට, කුරුළු පිහාටු ආදී ද්‍රව්‍ය ආකර්ශනීය ලෙස ඇසුරුම් කර නගරයේ පොත් සාප්පුවලට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ප්‍රවීන් විසින් පවත්වාගෙන යනු ලබයි. ''ප්‍රවීන් මල්ටි ප්‍රඩක්ට්ස්'' ලෙස නම් කර ඇති මෙම ව්‍යාපාරයේ නිෂ්පාදිත සඳහා ප්‍රාථමික අංශයේ පාසල් සිසුන්ගෙන් ඉහළ ඉල්ලුමක් පවතී.

01. ප්‍රවීන්ගේ ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය වනුයේ,

(i) ආහාර (ii) ක්‍රියාකාරකම් (iii) අධ්‍යාපනය (iv) විනෝදාස්වාදය

02. ඉහත සිද්ධියේ දක්වෙන කැළයෙන් අහුලාගත් විවිධ ද්‍රව්‍ය අයත්වන නිෂ්පාදන සාධකය වන්නේ,

(i) භූමිය (ii) ශ්‍රමය (iii) ප්‍රාග්ධනය (iv) ව්‍යවසායකත්වය

03. මෙම ව්‍යාපාරයේ ව්‍යාපාර අවස්ථාවකි.

(i) ප්‍රවීන්ගේ ව්‍යවසායකත්ව හැකියාව

(ii) නගරයේ පොත් සාප්පු වල තරගකාරී ව්‍යාපාරිකයන්ගේ පොත් තිබීම.

(iii)ප්‍රාථමික අංශයේ ක්‍රියාකාරකම් සඳහා මෙවැනි ද්‍රව්‍ය අවශ්‍ය වීම.

(iv)මෙම ද්‍රව්‍ය ආකර්ශනීය ලෙස ඇසුරුම් කිරීමේ හැකියාව

04. ඉහත සිද්ධියට අදාලව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ''සියලුම පාසැල් ළමුන්'' මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයකි.

(ii) ප්‍රවීන්ගේ ඉලක්ක වෙළෙඳපොල ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ය.

(iii) ප්‍රවීන් සිල්ලර වෙළෙඳාමේ යෙදේ.

(iv) ආකර්ශනීය ඇසුරුම අලෙවි මිශ්‍රයේ ප්‍රවර්ධන විචල්‍යයට අයත් ය.

Remove Watermark Now

05. ''ප්‍රවීන් මල්ටි ප්‍රඩක්ට්ස්'' ව්‍යාපාරය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(i) නෛතික පුද්ගලභාවයක් නැත.

(ii) අයිතිකරුගේ වගකීම අසීමිතය.

(iii) ඒක පුද්ගල ව්‍යාපාර සංවිධානයකි.

(iv) අඛණ්ඩ පැවැත්මක් තිබීම.

06. ඇල්මැති පාර්ශවයන් ව්‍යාපාර තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු කිහිපක් පහත දැක්වේ.

A-ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම.

B-දෙන ලද ණය අයකර ගැනීම.

C-ප්‍රමාණවත් ලාභ ලැබීම.

D-තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

ඉහත A,B,C හා D යන අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන පාර්ශවයන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) ගණුදෙනුකරුවෝ, මූල්‍ය ආයතන, කළමනාකරුවෝ, අයිතිකරුවෝ

(ii) සැපයුම්කරුවෝ, රජය, සේවකයෝ, ගණුදෙනුකරුවෝ

(iii) ගනුදෙනුකරුවෝ, මූල්‍ය ආයතන, අයිතිකරුවෝ, කළමනාකරුවෝ

(iv) සේවකයෝ, අයිතිකරුවෝ, තරගකරුවෝ, කළමණාකරුවෝ

07. ව්‍යාපාරයකට බලපාන අභ්‍යන්තර පාරිසරික සාධක පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

(i) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සැපයුම්කරුවෝ

(ii) කළමනාකරුවෝ, සේවකයෝ, ගණුදෙනුකරුවෝ

(iii) සේවකයෝ, අයිතිකරුවෝ, කළමනාකරුවෝ

(iv) ගණුදෙනුකරුවෝ, අයිතිකරුවෝ, කළමනාකරුවෝ

- ව්‍යාපාර සංවිධාන වර්ගවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

B. නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම.

C. ලියාපදිංචිය අනිවාර්ය වීම.

D. අයිතිකරුගේ වගකීම අසීමිත වීම.

E. සාමාජිකයන්ගේ සාමුහික අයිතිය.

08. තනි පුද්ගල ව්‍යාපාරවල ලක්ෂණ පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

(i) ABC (ii) BCD (iii) ADE (iv) ABD

papers.lk
pdfelement

Remove Watermark Now

09. රාජ්‍ය දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(i) නෛතික පුද්ගලභාවයක් ඇත.

(ii) අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වේ.

(iii) අයිතිය හා පාලනය රජය සතු වේ.

(iv) රජයේ මූල්‍ය නීති සංග්‍රහයට අනුව කටයුතු කිරීම.

10. චෙක්පතකට අදාළව අණකරු යනු,

(i) ජංගම ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකුව

(ii) චෙක්පත ලියා අත්සන් කරන්නා

(iii) චෙක්පතේ නම සඳහන් පුද්ගලයා

(iv) චෙක්පතට ගෙවීම් ලැබීමට හිමිකම් ඇති පුද්ගලයා

11. X තීරයේ වෙළෙඳාමේ ප්‍රභේද සහ Y තීරයේ එම ප්‍රභේද සඳහා නිදසුන් ද දැක්වේ.

| | X | | Y |
|---|---|---|---|
| (i) | සිල්ලර වෙළෙඳාම | A ● | ඉන්දියාවෙන් මෙරටට පාවහන් ගෙන්වීම. |
| (ii) | ආනයන වෙළෙඳාම | B ● | දන්සැලක් සඳහා පොල්ගෙඩි 100 ක් මිලදී ගැනීම. |
| (iii) | තොග වෙළෙඳාම | C ● | ඇඟළුම් නිෂ්පාදිත ඇමෙරිකාවට අලෙවි කිරීම. |
| (iv) | අපනයන වෙළෙඳාම | D ● | සිල්ලර වෙළෙන්දෙකුට අල කිලෝ 10 ක් විකිණීම. |

X හා Y තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| | | | | |
|---|---|---|---|---|
| (i) | 1-D | 2-E | 3-B | 4-A |
| (ii) | 1-B | 2-A | 3-D | 4-C |
| (iii) | 1-C | 2-D | 3-B | 4-A |
| (iv) | 1-B | 2-A | 3-C | 4-D |

- නුවන්ට අයත් රු.1,400,000/- ක් වටිනා මෝටර් රථය ඔහු එම මුදලටම රක්ෂණය කර ඇත. හදිසි අනතුරකින් මෝටර් රථයට රු.200,000 ක හානියක් සිදු විය. ඒ සඳහා නුවන් ඉල්ලා සිටින වන්දි මුදල රු.350,000/- කි.

12. නුවන්ට අදාළ රක්ෂණ සමාගමෙන් ලැබෙන වන්දි මුදල කොපමණද?

(i) රු.150,000 කි. (ii) රු.200,000 කි. (iii) රු.350,000 කි (iv) රු.1,400,000 කි.

13. එම වන්දි මුදල තීරණය වන්නේ කුමන රක්ෂණ මූලධර්මය පදනම් කරගෙනද?

(i) උපරිම විශ්වාසය

(ii) රක්ෂ්‍ය හිමිකම

(iii) හානි පූර්ණය

(iv) රක්ෂ්‍ය හිමිකම හා උපරිම විශ්වාසය

14. සන්නිවේදන මාධ්‍ය සහ එම මාධ්‍යයට අදාළ ක්‍රම පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) වාචික - දුරකථන සංවාද

(ii) මාර්ග සංඥා - සංකේත හා සංඥා

(iii) ලිඛිත - රැස්වීම

(iv) වෙබ් අඩවි - විද්‍යුත්

15. මගීන් ප්‍රවාහනය කරන විශාල නෞකාවකට අදාළව ප්‍රවාහන මූලිකාංගය හා නිදසුන පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) ජල මාර්ග - මාර්ගය

(ii) ඩීසල් - බලය

(iii) මාධ්‍ය - නෞකාව

(iv) වරාය - පර්යන්තය

16. අලෙවි කළමනාකරු විසින් නිෂ්පාදිත වඩාත් ආකර්ශනීය ලෙස ඇසුරුම් කිරීම සඳහා නව ඇසුරුම් යන්ත්‍රයක් මිලදීගෙන ඇත.

මෙම සිද්ධියට අදාළව කළමනාකරණයේ කාර්යය සහ අලෙවි මිශ්‍රයේ විචල්‍ය පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

(i) සැලසුම්කරණය - නිෂ්පාදිතය

(ii) සංවිධානකරණය - ප්‍රවර්ධනය

(iii) මෙහෙයවීම - ස්ථානය

(iv) සංවිධානකරණය - නිෂ්පාදිතය

17. ජංගම වත්කම් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(i) ණය ගැතියෝ, භාණ්ඩ තොගය, බැංකු ණය

(ii) භාණ්ඩ තොගය, මුදල්, ආයෝජන

(iii) යන්ත්‍ර උපකරණ, මෝටර් රථ, ඉඩම් ගොඩනැගිලි

(iv) මුදල්, ණයගැතියෝ, භාණ්ඩ තොගය

18. පහත දැක්වෙන ගනුදෙනු අතුරෙන් වත්කම් හා හිමිකම් අඩුවීමට බලපාන ගණුදෙනුව වන්නේ,

(i) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු.10,000 ක ලී බඩු මිලදී ගැනීම.

(ii) ණය හිමියන්ට රු.20,000 ක් ගෙවීම.

(iii) රක්ෂණ ගාස්තු රු.6,000 ක් ගෙවීම.

(iv) බැංකු ණය වාරිකය රු.5000 ක් ගෙවීම.

papers.lk pdfelement

Remove Watermark Now

19. ගණුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දක්වේ.

| වත්කම් (රු.) = | හිමිකම් (රු.) + | වගකීම් (රු) |
|---|---|---|
| + 25000 | | + 25,000 |

(i) අයිතිකරු රු.25,000 ක් වටිනා යතුරපැදිය ව්‍යාපාරයට යෙදීම.

(ii) රු.25,000 ක බඩු තොගයක් ණයට විකිණීම.

(iii) සිල්වා සමාගමෙන් රු.25,000 ක් වටිනා කිරුම් මිනුම් උපකරණයක් මිලට ගැනීම.

(iv) රු.25,000 ක් තැන්පත් කර ජංගම ගිණුමක් ආරම්භ කිරීම.

20. ව්‍යාපාරයක සිදුවූ ගණුදෙනුවක් පහත දක්වේ.

''ණය හිමියෙකු වූ තරංගට රු.5,000 ක් ගෙවීම'' ඉහත ගනුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

(i) ලදුපත - මුදල් පොත

(ii) මුදල් පොත - ගෙවීම් වවුචරය

(iii) ගෙවීම් වවුචරය - මුදල් පොත

(iv) විකුණුම් ඉන්වොයිසිය - විකුණුම් ජර්නලය

21. වැඩි වීම් හර, අඩු වීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන ගිණුමකි,

1. දුන් වට්ටම් ගිණුම
2. ලද වට්ටම් ගිණුම
3. විකුණුම් ගිණුම
4. ගෙවල් කුලී ආදායම් ගිණුම

22. ගණුදෙනුවක් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහනක් පහත් දක්වේ.

මුදල් හර 50,000

බැංකු ගිණුම බැර 50,000

ඉහත ගණුදෙනුව නිසා ව්‍යාපාරයේ,

(i) වත්කම් වැඩි වේ - වගකීම් අඩු වේ.

(ii) වත්කම් වැඩි වේ - වගකීම් වැඩි වේ.

(iii) වත්කම් වැඩි වේ - වත්කම් අඩු වේ.

(iv) වත්කම් වැඩි වේ - හිමිකම් වැඩි වේ.

23. සෑම විටම හර ශේෂයක් පෙන්නුම් කෙරෙන ගිණුමක් වන්නේ,

(i) ණයහිමි ගිණුම

(ii) බැංකු ගිණුම

(iii) කොමිස් ආදායම් ගිණුම

(iv) බැංකු ණය පොලී ගිණුම

papers.lk pdfelement

Remove Watermark Now

24. වත්කමක මෙන්ම වගකීමක ද දැකිය හැකි ලක්ෂණය වන්නේ,

(i) ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.

(ii) වර්තමාන බැඳීමක් පැවතීම.

(iii) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.

(iv) අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

25. මිහිරි ව්‍යාපාරයේ 2019/01/01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
| 250,000 | = | 180,000 | + | 70,000 |

රු. 20,000/- ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු.25,000 කට ණයට විකිණීමෙන් පසු ගිණුම්කරණ සමීකරණය පවතින ආකාරය වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (i) | 280,000 | = | 180,000 | + | 100,000 |
| (ii) | 255,000 | = | 185,000 | + | 70,000 |
| (iii) | 275,000 | = | 205,000 | + | 70,000 |
| (iv) | 270,000 | = | 180,000 | + | 90,000 |

26. ව්‍යාපාරයක ලාභය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

(i) ආදායම හා වියදම අතර වෙනස සෑම විටම ලාභය වේ.

(ii) ලාභය යනු වියදම ඉක්මවූ ආදායම යි.

(iii) ලාභය නිසා අයිතිකරුගේ හිමිකම වැඩි වේ.

(iv) සෑම විටම ව්‍යාපාරයේ ලාභය හිමිවන්නේ අයිතිකරුට ය.

27. ලද වට්ටම් ගිණුම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(i) භාණ්ඩ ණයට ගැනීමේ දී මුළු වටිනාකමින් අඩු කරනු ලබන අගය

(ii) භාණ්ඩ අත්පිට මුදලට ගැනීමේ දී මුළු වටිනාකමෙන් අඩු කරනු ලබන අගය

(iii) ගිවිසගත් කාලය තුළ ණය හිමියන්ට, මුදල් ගෙවීමේ දී අඩු කරන අගය

(iv) ගිවිසගත් කාලය තුළ ණය ගැතියන්ගෙන් මුදල් ලැබීමේදී අඩු කරන අගය

28. බැංකු අයිරාව,

(i) වත්කමකි.

(ii) වගකීමකි.

(iii) ආදායමකි.

(iv) වියදමකි.

29. බැංකු ප්‍රකාශනයක හර පැත්තේ සටහන්ව තිබූ රු.10,000/-

(i) සෘජු ප්‍රේෂණයකි.

(ii) මුදල් තැන්පත් කිරීමකි.

(iii) චෙක්පත් තැන්පත් කිරීමකි.

(iv) ස්ථාවර නියෝග මත කළ ගෙවීමකි.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 30,31,32 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක 2019 අගෝස්තු 30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.12,000/- කි. එදිනට ලද බැංකු ප්‍රකාශනයේ වෙනස් ශේෂයක් දක්නට ලැබුණි. වෙනසට හේතු මෙසේය.

A - බැංකු ගාස්තු රු.1200

B - සෘජුවම ලැබී තිබූ ණයගැති ප්‍රේෂණ රු.4,000

C - නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු.4800 කි.

D - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් වටිනාකම රු.5,000 කි.

30. බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා අඩු අගයක් ගැනීමට බලපා ඇති ගනුදෙනු වන්නේ,

(i) AC (ii) BC (iii) BD (4) AB

31. බැංකු ගිණුම සංශෝධනය කිරීමට යොදාගන්නා ගනුදෙනු වන්නේ,

(i) AC (ii) A,B (iii) AD (4) BC

32. 2019/08/30 දිනට සංශෝධිත මුදල් ශේෂය වන්නේ,

(i) රු.9,200 කි. (ii) රු.14,600 කි. (iii) රු.14,800කි. (iv) රු.15,000 කි.

33. සරලාගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු.4,000 කි. 2019 ජනවාරි මාසයේ සුළු වියදම් එකතුව රු.3,700 කි. 2019 පෙබරවාරි පළවන දින රු.4,700 ක් ප්‍රතිපූර්ණය කරන ලදි. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

(i) පෙබරවාරි මාසයේ සුළු මුදල් අග්‍රිමය රු.700 කින් වැඩි කර ඇත.

(ii) පෙබරවාරි මාසයේ සුළු මුදල් අග්‍රිමය රු.5,000 කි.

(iii) ජනවාරි 31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු.300/- කි.

(iv) පෙබරවාරි මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය රු.1000 කින් වැඩි කර ඇත.

34. පහත දැක්වෙන ගනුදෙනු අතුරෙන් ගැනුම් ජර්නලයේ සටහන් කෙරෙන ගනුදෙනුව කුමක්ද?

(i) රු.10000/- බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම.

(ii) රු.16,000/- බඩු තොගයක් ණය පදනම මත ගැනීම.

(iii) රු.20,000/- ක් වටිනා කාර්යාල උපකරණ ලක්දිව සමාගමෙන් ගැනීම.

(iv) ණය හිමියන්ට රු.21,000/- ක් ගෙවීම.

Remove Watermark Now

35. නදීරගේ ව්‍යාපාරයේ විකුණුම් ජර්නල පහත දැක්වේ.

| දිනය | ① ...................... | ② ......................... | වටිනාකම (රු.) | ලෙ/පි |
|---|---|---|---|---|
| 2019/01/08 | 836 | ගයාන් | 6,000 | |
| 2019/01/22 | 837 | සාරංග | 8,000 | |
| 2019/01/31 | | එකතුව..③......ගිණුමට බැර කළා | 14,000 | |

ඉහත විකුණුම් ජර්නලයේ①,②,③යන ස්ථානවලට අදාළ යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. ලදුපත් අංකය, විකුණුම්කරු, විකුණුම්
2. ඉන්වොයිස් අංකය, ගැනුම්කරු, ගැනුම්
3. වවුචර් අංකය, ගැනුම්කරු, විකුණුම්
4. ඉන්වොයිස් අංකය, ගැනුම්කරු, විකුණුම්

36. ව්‍යාපාරයක ගිණුම් සියල්ල එක් රැස් කර ඇති ස්ථානය හඳුන්වන්නේ,
    1. ජර්නලය ලෙසයි.
    2. ශේෂ පිරික්සුම ලෙසයි.
    3. ලෙජරය ලෙසයි.
    4. උපයෝගී පොත් ලෙසය.

37. සමනල ඡරනිචර්ස් වෙතින් ලී බඩු ණයට ලබා ගැනීමෙන් ඇති වූ වගකීම පියවීම සඳහා රු.15,000 ක චෙක්පතක් එම සමාගමට නිකුත් කරන ලදි.
මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය සහ මූලික පොත පිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

(i) ගෙවීම් වවුචරය - මුදල් පොත
(ii) ජර්නල් වවුචරය - පොදු ජර්නලය
(iii) ගෙවීම් වවුචරය - බැංකු ගිණුම
(iv) ලදුපත - මුදල් පොත

38. ව්‍යාපාරයක පොදු ජර්නලයේ සටහන්ව තිබූ සංලක්ෂයක් පහත දැක්වේ.
(යන්ත්‍ර අලුත්වැඩියාවට වැය වූ රු.6,000 යන්ත්‍ර ගිණුමේ හරට සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම)
මෙම සංලක්ෂයට අදාළව පැවති ජර්නල සටහන වන්නේ,

(i) යන්ත්‍ර ගිණුම හර රු.6,000, මුදල් බැර රු.6,000
(ii) අවිනිශ්චිත ගිණුම හර රු.6,000, යන්ත්‍ර ගිණුම බැර රු.6,000
(iii) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර රු.6,000, අවිනිශ්චිත ගිණුම බැර රු.6,000
(iv) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර රු.6,000, යන්ත්‍ර ගිණුම බැර රු.6,000

Remove Watermark Now

39. ව්‍යාපාරයක් සකස් කළ ශේෂ පිරික්සුමක හර තීරයේ එකතුව රු.420,000 ක් ද බැර තීරයේ එකතුව රු. 380,000 ක් ද විය. මෙම වෙනසට හේතුව ලෙස අනාවරණය වූයේ,

(i) ලද පොලී ගිණුමේ ශේෂය වූ රු.40,000 ශේෂ පිරික්සුමේ හර තීරයේ සටහන් කිරීම.

(ii) ණය ගැතියෙකුගෙන් ලද රු.20,000 මුදල් පොතේ මෙන්ම ණයගැති ගිණුමේද හරට සටහන් කර තිබීම.

(iii) රු.40,000 ක ගැණුම් ඉන්වොයිසියක් පොත්වලින් සම්පූර්ණයෙන් මගහැරීම.

(iv) විකුණුම් ගිණුමේ බැර පැත්ත රු.20,000 ක් අඩුවෙන් එකතු කර තිබීම.

40. ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමට භාවිතා කරන මූලික සටහන් පොත කුමක්ද?

(i) අවිනිශ්චිත ගිණුම (ii) පොදු ජර්නලය

(ii) ගැනුම් ජර්නලය (iv) මුදල් පොත

papers.lk

pdfelement